# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
2171635
Po.Box No } 10120

ෆැක්ස්
தொலைநகல் } 011-
Fax

දුරකථන
தொலைபேசி
Telephone } 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site } www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail } dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO } 1642/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No } / 2024

දිනය
திக
Date } 27 /10 /2024
පැය 0545

# මාධ්‍ය නිවේදනය

**01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවකු හා ඊට ආධාර අනුබල දුන් සැකකරුවෙකු හා සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපළ ඒකකය.**

2024.10.26 වන දින උදෑසන කාලයේ කටුනායක ගුවන්තොටුපළ පැමිණීමේ පර්යන්ත පරිශ්‍රයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ ගුවන්තොටුපළ ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය කිලෝ 05 ග්‍රෑම් 26** ක් මැලේසියාවේ සිට ගුවන් මගින් මෙරටට රැගෙන පැමිණි සැකකරුවෙකු **අත්අඩංගුවට ගෙන ඇති අතර, සැකකරු රැගෙන යාමට කාර් රථයකින් පැමිණි සැකකරුවෙකු හා සැකකාරියක් ඊට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් කාර් රථයද සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 51 ක් වූ ගොතටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර, ආධාර අනුබල දීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වූ වැබොඩ ප්‍රදේශයේ පදිංචි හා සැකකාරිය වයස අවුරුදු 33ක් වූ වාද්දූව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කටුනායක පොලිස් ස්ථානය.**

2024.10.26 වන දින දහවල් කාලයේ කටුනායක පොලිස් වසමේ ආඬිඅම්බලම ප්‍රදේශයේදී කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 102 මිලිග්‍රෑම් 300** ක් සන්තකයේ තබාගෙන යතුරු පැදියකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 30 ක් වන දෙමන්හන්දිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදුකළ විමර්ශනයේදී විදේශ රටක සිට මෙහෙයවන ලබන මත්ද්‍රව්‍ය ජාවාරමකට සම්බන්ධ වෙමින් යතුරු පැදියෙන් ගොස් මත්ද්‍රව්‍ය බෙදාහරින ලද සැකකරු බවට අනාවරණය වී ඇත. කටුනායක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.

2024.10.26 වන දින සවස් කාලයේ වැල්ලම්පිටිය පොලිස් වසමේ කොලොන්නාව ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 51 මිලි ග්‍රෑම් 250 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන කොලොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. ගිනි අවියක් හා ජීව පතරොම් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශය.

2024.10.26 වන දින උදෑසන කාලයේ හබරාදූව පොලිස් වසමේ මීපේ හන්දිය ප්‍රදේශයේදී මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් හා ටී 56 අවියට යොදනු ලබන ජීව පතරොම් 06ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන මීපේ, හබරාදූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරු සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී මොහු මත්ද්‍රව්‍ය සඳහා තදින් ඇබ්බැහි වූ අයෙකු වන අතර, මනුෂ්‍ය ඝාතනයක් සිදු කිරීම සඳහා අත්අඩංගුවට ගත් ගිනි අවිය සැකකරුට තවත් පුද්ගලයෙකු විසින් ලබා දී ඇති බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය විය.

මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - වාද්දූව පොලිස් ස්ථානය.

2024.10.26 වන දින සවස් කාලයේ වාද්දූව පොලිස් වසමේ එම්.ඩී.එල්. වත්ත ප්‍රදේශයේදී වාද්දූව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන වාද්දූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

වාද්දූව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - හොරණ පොලිස් ස්ථානය.

2024.10.27 වන දින අළුයම් කාලයේ හොරණ පොලිස් වසමේ දෙල්ගහගොඩැල්ල ප්‍රදේශයේදී හොරණ පොලිස් ස්ථානයේ නිලධාරීන්

කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 48 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන කළුපහන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

හොරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - හැටන් කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.

2024.10.26 වන දින රාත්‍රී කාලයේ බගවන්තලාව පොලිස් වසමේ ට්ංසිං ප්‍රදේශයේදී හැටන් කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බලපත්‍ර නොමැතිව මැණික් ගරමින් සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන** බගවන්තලාව පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 46, 48 ක් වන බගවන්තලාව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

බගවන්තලාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 08. වීසා නොමැතිව රැඳී සිටි විදේශීය යුවලක් අත්අඩංගුවට - මහනුවර සංචාරක පොලිස් ඒකකය.

2024.10.26 වන දින සවස් කාලයේදී මහනුවර පොලිස් වසමේ හන්තාන ප්‍රදේශයේදී මහනුවර සංචාරක පොලිස් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **ආගමන විගමන නීති උල්ලංඝනය කරමින් වීසා නොමැතිව මෙරට රැඳී සිටි විදේශීය යුවලක්** අත්අඩංගුවට ගෙන මහනුවර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන අතර සැකකාරිය වයස අවුරුදු 32 ක් වන රුසියන් ජාතිකයන් වේ.**

මහනුවර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. දියේ ගිලී මියයාමක් - නිට්ටඹුව පොලිස් වසම.

2024.10.26 වන දින දහවල් කාලයේ නිට්ටඹුව පොලිස් වසමේ දඹුවුව ප්‍රදේශයේදී අත්තනගලු ඔයේ දියනෑමට ගිය පුද්ගලයෙකු දියේ ගිලී මියගොස් ඇති බවට නිට්ටඹුව පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 20 ක් වූ හපුතලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මියගිය පුද්ගලයා නිට්ටඹුව පොලිස් වසමේ තාවකාලිකව පදිංචිව සිටිමින් පුද්ගලික ආයතනයක සේවය කරන බවටත්, මිතුරන් කිහිප දෙනෙකු සමග දියනෑමට ගිය අවස්ථාවේ මෙම අනතුර සිදුව ඇති බවට විමර්ශන වලදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය වතුපිටිවල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර, නිට්ටඹුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - අවිස්සාවේල්ල පොලිස් වසම.

2024.10.26 වන දින අළුයම් කාලයේ අවිස්සාවේල්ල පොලිස් වසමේ කොළඹ රත්නපුරය මාර්ගයේ නාවැටිය ප්‍රදේශයේදී රත්නපුරය දෙස සිට අවිස්සාවේල්ල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් ඊට ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි ටිපර් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ පිටුපස ගමන් ගත් පුද්ගලයෙකු බරපතල තුවාල ලබා අවිස්සාවේල්ල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 34 ක් වූ වේවැල්දෙනිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අවිස්සාවේල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුරට අදාල ත්‍රීරෝද රථයේ රියදුරු හා ටිපර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර අවිස්සාවේල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - නොරච්චෝලය පොලිස් වසම.

2024.10.26 වන දින රාත්‍රී කාලයේ නොරච්චෝලය පොලිස් වසමේ කල්පිටිය පාලාවිය මාර්ගයේ කරඹ ප්‍රදේශයේදී පාලවිය දෙස සිට කල්පිටිය දෙසට ධාවනය වූ යතුරු පැදියකින් පසු පැදිකාරිය ඇද වැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් පසු පැදිකාරිය බරපතල තුවාල ලබා පුත්තලම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 46 ක් වූ සේතපොල, මාම්පුරිය ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් යතුරු පැදිකරු අත්අඩංගුවට ගෙන ඇත. නොරච්චෝලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 12. මාරක රිය අනතුරක් - අනුරාධපුර පොලිස් වසම.

2024.10.27 වන අද දින අළුයම් කාලයේ අනුරාධපුර පොලිස් වසමේ අනුරාධපුර විලච්චිය මාර්ගයේ අක්කර 25 හන්දියේදී අනුරාධපුර දෙස සිට විලච්චිය දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන තාප්පයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් පැදිකරු හා පසුපැදිකරු අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 33 ක් වූ සංඝමිත්තා මාවත, තිසාවැව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**